# අලෙවි කරණය හා ප්‍රවාහන ප්‍රශ්න

කෘෂි ද්‍රව්‍ය නිෂ්පාදනයේ මූලිකව කටයුතු කරන ගොවියාගේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා එම කෘෂි ද්‍රව්‍ය පැමිණීමේදී එම ක්‍රියාවලියට අදාල සියළුම කාර්යයන් අලෙවිය යන්නෙන් අදහස් කෙරේ. කෘෂි ද්‍රව්‍ය එකතු කිරීම, ඇසිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, පාරිභෝගිකයාට විකිණීම යන කාර්යයන් කිහිපයක් අලෙවිය තුල අන්තර්ගත වේ.

කෘෂි නිෂ්පාදන අලෙවිය රටක ආර්ථික හා සමාජ සංවර්ධනයෙහි ලා ඉතා වැදගත් තැනක් ගනී. රටක් නිෂ්පාදනය වැඩිකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත්තාවිට අලෙවිය වැඩිදියුණු නොකළහොත්, එම කාර්යය පලරහිතවේ. තමන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය තමන් විසින්ම නිපදවා ගැනීමේ යැපුම් ආර්ථික ක්‍රමයක් ලොව කිසි තැනක දක්නට නැත. සෑම ගොවියෙක්ම වාගේ නිෂ්පාදනය කරන්නේ පවුලේ ප්‍රයෝජනයට අමතරව වෙළඳ පල දෙස නෙත් යොමා ගෙනය. මේ නිසා ඔහු නිෂ්පාදනයේ අතිරික්ත ප්‍රමාණය අලෙවි කරගැනීමට


පර්යේෂණ හා පුහුණු කිරීමේ නිළධාරි

**ආර්. පී. ශ්‍රී. සතිරණ**

විසිනි.


මාර්ග සොයයි. මෙහිදී තම අතිරික්තය පහසුවෙන් හා වැඩිම මිළකට අලෙවි කර ගැනීම ඔහුගේ පරමාර්ථයයි. ඒ අනුව කෘෂි නිෂ්පාදන අලෙවිය ඔහුගේ ආදයමට බොහෝවින් බලපායි. තමන් නිපදවන ආහාර භෝග කෙලින්ම පාරිභෝගිකයා විසින් මිලදී ගන්නේ නම් අලෙවිය පිළිබඳ ඒ තරම් ප්‍රශ්නයක් ඇතිවන්නේ නැත. නමුත් අද ගොවියා විසින් නිපදවන ආහාර බෝගයන් පරිභෝජනය කරන්නේ බොහෝවිට සැතපුම් සිය ගණනක් ඈත සිටින පාරිභෝගිකයෙකු විසිනි. උදහරණයක් ලෙස නුවරඑලියේ හෝ බදුල්ලේ සිටින ගොවියෙක් එලවළු නිපදවූ පමණින් කොළඹ සිටින පාරිභෝගි-කයෙකුට එය සැපයූවා නොවේ. ගොවියා නිපදවූ එලවළු තවත් පුද්ගලයෙකු මාර්ගයෙන් ප්‍රවාහන නියෝජිතයෙක් ලබාගෙන එම එලවළු තොග වෙළෙන්දෙකුට විකුණා එම තොග වෙළෙන්ද සිල්ලර වෙළෙන්දෙකුට විකුනා එම සිල්ලර වෙලෙන්දගෙන් අවසාන පාරිභෝගිකයාට යන ආකාරයට විය හැක. ඒ අනුව නුවරඑලිය හෝ බදුල්ලේ ගොවියා වවන එලවළු කොළඹ පාරිභෝ-ගිකයා අතට ලබා දීමේදී එලවළු එකතු කරන්නන්, ප්‍රවාහන නියෝජිතයින්, තොග වෙලදුන්, සිල්ලර වෙලඳුන් යන අතර මැදියන් විශාල සංඛ්‍යාවක් සම්බන්ධවී ඇති අතර, කොළඹ සිටින පාරිභෝගිකයාට එලවළු සැපයීමේදී ගොවියා වගේම මේ අතර මැදියන්ද ඉතා වැදගත් වන බව පෙනේ. ගොවියා හා අවසාන පාරිභෝගිකයා අතර පරතරය වැඩි වන්නට වැඩිවන්නට ගොවියාගේ සිට පාරිභෝ-ගිකයා දක්වා භාණ්ඩ ගලා යාමේදී ඒ සඳහා නියැලී සිටින අතර මැදියන් සංඛ්‍යාව වැඩිවේ. එනම් අලෙවිය වඩාත් සංකීර්ණ විය හැක. කෙසේ වෙතත් අලෙවියට සම්බන්ධ අතර මැදියන්ගේ ප්‍රධාන කාර්යය වන්නේ අවශ්‍ය බෝග අවශ්‍ය ආකාරයට අවශ්‍ය වෙලාවට අවසන් පාරිභෝගිකයාට ලබා දීමයි.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය මූලික වශයෙන් වතු අංශය සහ දේශීය අංශය ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙද වෙන් කළ හැක. වතු අංශය ගත්කල එයට ප්‍රධාන වශයෙන් තේ, පොල්, රබර් නිෂ්පාද-නය අයත් වන අතර, තවත් සුළු අපනයන බෝග නිෂ්පාදනයද එයට අයත් වේ. මේ බෝග සියල්ලක්ම පාහේ බොහෝයෙයින් අපනයනය කිරීම සඳහා නිපදවන බෝගයන් වන අතර ඒවා සඳහා හොඳින් සංවිධානය වූ අලෙවි රටාවක් ඇත'

වී, එලවළු, පලතුරු හා අතිරේක බෝග නිෂ්පාදනය කිරීම සහ ඇතිකිරීම දේශීය කෘෂි කර්මාන්තයේ ප්‍රධාන වන අතර, ඒවා බොහෝ සෙයින් දේශීය පරිභෝජනය සඳහා සකස් වූ ඒවා වෙයි. එනිසා ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන අලෙවි යේදී දේශීය අංශයේ නිපදවන මෙම බෝග මූල්

තැනක් ගනී. දේශීය අංශයේ නිපදවන බෝග අතරින් වී හා අනිකුත් අතිරේක බෝග වර්ග එනම් මුංඇට, කව්පි, මිරිස්, රතුළූනු හා අර්තාපල් ආදිය නරක් නොවී සෑහෙන කාලයක් තබාගත හැකි බෝග වුවත් එළවළු හා පලතුරු ඉතා ඉක්මනින් නරක්වන සුළු ඒවාය. පොදුවේ ගත් කල එම ද්‍රව්‍ය සියල්ලක්ම අනිකුත් ද්‍රව්‍යවලට සාපේක්ෂකව ඉතා ඉක්මනින් නරක්වන සුළු ඒවාය. එම නිසා එම ද්‍රව්‍ය සියල්ලක්ම ඉතා කෙටි කාලයකින් පරිභෝජනය කල යුතුය. එබැවින් එම ද්‍රව්‍ය හැකි ඉක්මනින් ගොවිපලේ සිට අවසාන පාරිභෝගිකයා වෙත ලඟා කරවීම අලෙවියට ඇති වගකීමයි. මෙම නිසා කාර්යක්ෂම හැඩගැසුනු අලෙවි රටාවක් ඒ සඳහා තිබිය යුතුය. මෙය ඉතාම වැදගත් වන්නේ එළවළු සහ පලතුරු සඳහාය. සෑම පාරිභෝගිකයෙක්ම වඩා කැමති වන්නේ තමාට අවශ්‍ය ආහාර බෝග අලුත්, හොඳ පෙනුමකින් ලබා ගැනීමටය. ඇත්ත වශයෙන්ම අලෙවි ක්‍රමයට පැවරී ඇති ප්‍රධාන කාර්යය එයයි එනම් අවශ්‍ය බෝගය අවශ්‍ය ආහාරයට අවශ්‍ය පුද්ගලයාට සැපයීමය. මෙම කාර්ය කාර්යක්ෂම කිරීමට බොහෝ විට එම බෝග සඳහා යොදා ගන්නා ප්‍රවාහන ක්‍රමය බලපායි මක් නිසාද යත් එම බෝග ඉතා කෙටි කාලයකින් අවසාන පාරිභෝගිකයා අතට පත්කල යුතු බැවිනි.

මෙහිදී මතුවන තවත් ප්‍රශ්නයක් නම් පාරිභෝගිකයාට ලැබෙන ආහාර බෝග බොහෝවිට අවශ්‍ය ආකාරයට එනම් අලුත්, හොඳ පෙනුමකින් නොවීමයි. එළවළු වැනි ද්‍රව්‍ය පාරිභෝගිකයා අතට පත් වන විට දින දෙකක් පමණ ගතවී ඒවායේ අලුත් බව නැතිවී ඇත. කොළ එළවළු බොහොමයක් තැළී කුණුවී, සමහර විට පාවිච්චියට පවා නුසුදුසු තත්ත්වයකට පත්වී ඇත.

මේනිසා අපතය වැඩිවේ. එළවළු හා පලතුරු සඳහා සාමාන්‍යයෙන් අපතේ යන ප්‍රමාණය 10–20% දක්වා පමණ වේ වැඩිපුරම අපතේ යාම සිදු වන්නේ සිල්ලර වෙළඳ මට්ටමේදීය. කෙසේ වෙතත් මේ අපතේ යාමට ගොවිපලේ සිට අවසාන පාරිභෝගිකයාට ඇති පරතරයට අමතරව ප්‍රවාහනයේදී යොදගන්නා ඇසුරුම් රටාව බෙහෙවින් බලපායි.

ඇසිරීම සඳහා බොහෝවිට ප්‍රයෝජනයට ගන්නේ ගෝනි සහ ලෑලි පෙට්ටියි. මෙම ඇසුරුම් ක්‍රම සහල් සහ අතිරේක බෝග සඳහා යෝග්‍ය වුවත් එළවළු පලතුරු වැනි ඉතා ඉක්මනින් නරක්වන ඒවා සඳහා එය එතරම් හොඳ ක්‍රමයක් නොවේ. සමහර විට ගෝනි හෝ පෙට්ටි වල ඒවායේ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණ දමා ඇසිරීම නිසා



වෙළෙන්දන් එළවළු වෙළෙඳපොලට ගෙන ඒමට ගොඩගසා ඇති අයුරු

ඒවා ලොරිවල වහලවල් මත පටවාගෙන ප්‍රවාහනය කෙරේ. නිසි පරිදි වාතාශ්‍රය නොලැබීම හා අව්වැසි ආදියට ලක් වීමෙන් අපතේ යන ප්‍රමාණය වැඩිවීම ඉවහල් විය හැක. මෙය බොහෝ සෙයින් බලපාන්නේ එළවළු හා පලතුරු ප්‍රවාහනයේදීය.

බොහෝ එළවළු ප්‍රවාහනයේදී යොද ගන්නේ ගෝනිවල අසිරීයි මීට අමතරව තක්කාලි ඇසිරීම සඳහා බට පතුරු වලින් හෝ ලෑලි වලින් සාද ගත් පෙට්ටි ප්‍රයෝජනයට ගනී. පතෝල වැටකොලු වැනි එළවළු වර්ග ඇසිරීම සඳහා පොල් අතු යොද ගන්නා අතර, ඒ සඳහා කෙසෙල් පතුරුද යොදගනී. සමහර විට ලීක්ස්. බීට්, රාබු වැනි එළවළු සඳහාත් නිවිති සහ අනිකුත් කොළ එළවළු මිටි බැඳීමටද පොල් අතු යොද ගනී. පැපොල්, අඹ වැනි පලතුරු ඇසිරීම සඳහා ලෑලි පෙට්ටිද, මිදි සඳහා ලෑලි පෙට්ටි හෝ කාඩ්බෝඩ් පෙට්ටිද යොද ගනී. අන්නාසි සහ කෙසෙල් ඇසිරීම සඳහා කිසිදු ඇසුරුමක් උපයෝගී කර නොගන්නා අතර අලිගැටපේර, දොඩම්, දෙළි, දිවුල් සහ වැල් දොඩම් සඳහා ගෝනි උපයෝගී කර ගනී. මෙහිදී සැලකිලිමත් විය යුත්තේ මෙම ඇසුරුමේ ඇසිරිය හැකි තරම් ද්‍රව්‍ය ඒ තුල බහාලීමයි. ඇසිරිය හැකි ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ඒ තුල බහා පාගා තද කර ඇසිරීමෙන් අපතේ යන ප්‍රමාණය වැඩි වේ. බොහෝවිට ඇසිරීම කරනු ලබන්නේ ගොවිපල මට්ටමේදී නිසා මේ පිළිබඳ හොඳ දැනීමක් ගොවියාට නොමැතිවීම මෙයට හේතුව විය හැක. කෙසේ වුවත් ප්‍රවාහනය කිරීමේදී එක් එක් බෝගයට සුදුසු වන පරිදි තැනූ ලොරි හෝ වෑන් පාවිච්චි කිරීමට තරම් ශ්‍රී ලංකාවේ අලෙවි අංශය දියුණු වී නැත. අපේ රටේ අලෙවි රටාවේ ඇති අනෙක් වැදගත් කරුණ නම් යම් ප්‍රදේශයකින් අපේ ප්‍රධාන තම වෙළඳ නගරය වන කොළඹට ආහාර බෝග ගෙන එන ලොරියක් ආපසු යන්නේ එම ප්‍රදේශයට අවශ්‍ය වෙනත් ආහාර බෝගයක් රැගෙනය.

උදහරණයක් වශයෙන් නුවරඑලිය හෝ බදුල්ලෙන් බෝංචි, ලීක්ස් කැරට්, අර්තාපල්, ගෝවා වැනි එළවළු රැගෙන කොළඹට පැමිණෙන ලොරියක් ආපසු යන්නේ එම ප්‍රදේශයේ නිෂ්පාදනය නොකරන එම ප්‍රදේශයට අවශ්‍ය සහල්. වියලි මිරිස්, රතුළූනු වැනි ද්‍රව්‍යයන් රැගෙනය. තවත් කරුණක් නම් ආහාර රැගෙන ආ ගෝනි හා පෙට්ටි ආපසු ප්‍රවාහනය කිරීමද පවතින අලෙවි ක්‍රමයේ ඔවුන් සතු වගකීමක් වීමයි.

කැරට්, ගෝවා වැනි එළවළු වර්ග ගෝනි වල ඇසිරීමේදී මද වශයෙන් හෝ අපතේ යාම වලක්වා ගැනීම සඳහා ඒවා කොළ සමග ඇසිරීමට ගොවියා පුරුදුවී සිටීම අප අලෙවි රටාවේ තවත් වැදගත් ලක්ෂණයකි. කෙසේ වුවත් ගෝවා කැරට්, බීට්, වම්බටු, රාබු, අර්තාපල් වැනි එළවළු වර්ග ඇසිරීම සඳහා ගෝනි උපයෝගී කරන් ඒ සඳහා බට පතුරු වලින් සෑදූ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි උපයෝගී කර ගැනීමෙන් අපතේ යාම බොහෝ දුරට අඩුකර ගත හැක. නමුත් ප්‍රශ්නය වන්නේ ඒවා ආපසු ප්‍රවාහනයට අපහසු වීමයි. එම නිසා පාවිච්චි කිරීමට පහසු එනම් ආපසු ප්‍රවාහනයේදී එය හැකිලිය හැකි වන පරිදි ලෑලි වලින් හෝ වෙනත් ප්ලාස්ටික් වැනි ද්‍රව්‍යයකින් නිපදවූ පෙට්ටි විශේෂයක් ඇත්නම් එය ඇසිරීම සඳහා යොද ගත හැකිද යන්නය. එවිට මතුවන තවත් ප්‍රශ්නයක් නම් ඒ සඳහා යන වියදම ගෝනි සඳහා හා අපතේ යාම අඩුවීම යන කරුණු දෙකට තුලනය වේද යන්නයි. කෙසේ වෙතත් මෙම අංශය කෙරෙහි රජයේ හෝ වෙනත් ආයතනයකින් අවදනය යොමු වී නැත. ගොවීන් හා අලෙවියට සම්බන්ධ අනිත් පුද්ගලයින් තමන් අත්දැකීමෙන් ලත් දැනුම අනුව ඒ සඳහා හැඩ ගැසී තමන්ට යෝග්‍යයයි සිතන ඇසුරුම් ක්‍රම යොද ගනී. ඔවුන්ට අළුත් ඇසුරුම් ක්‍රම සොයා ගැනීම පිළිබඳ අදහසක් නැත. එය රාජ්‍ය අංශය මගින් ඉටුවිය යුතු කාර්යයකි. එනම් එක් එක් ඇසුරුම් ක්‍රම අත්හද බලා පර්යේෂණ කර ඒ ඒ බෝගය සඳහා වඩා යෝග්‍ය ඇසුරුම් ක්‍රමය හඳුන්වා දීම රාජ්‍ය අංශයෙන් ඉටුවිය යුතු කාර්යයකි.